# 2021 ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දින සැමරුම.

“ළමා ශ්‍රමය පිටු දැකීමේ ජාත්‍යන්තර වර්ෂය වන 2021 වර්ෂයේ ” ජුනි මස12 දිනට යෙදුන ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දිනයට සමගාමීව දෙපාර්තමේන්තුවේ, කාන්තා හා ළමා කටයුතු අංශය මඟින් වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අතරින් පහත විශේෂාංග ප්‍රධාන තැනක් ගන්නා ලදී.

- 2021.06.11 දින ගරු අමාත්‍ය තුමාගේ ප්‍රධානත්වයෙන් ළමා ශ්‍රමය හා සම්බන්ධ නීතිමය රාමුව පිළිබඳව සමාජය තුළ පුළුල් කථිකාවතක් නිර්මාණය කිරීම හා ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය ශූන්‍යත්වයට පත්කිරීමේ සමාජ වගකීම පිළිබඳව මහජනතාව ඇතුළු සියලු පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ වැඩමුළුවක් (Zoom තාක්ෂණය යොදාගනිමින්) පවැත්වීම.

- එහිදී ළමා ශ්‍රමය සම්බන්ධ තොරතුරු රැස්කර ගැනීමේ කොටස්කරුවන් වශයෙන් මාධ්‍ය ප්‍රජාවද සම්බන්ධ කරගනිමින් ළමා ශ්‍රමය හා අනතුරුදායක ළමා ශ්‍රමය පිළිබඳව මෑතකදී සිදු කළ සංශෝධන පිළිබඳව විධිමත් අවබෝධයක් ලබා දීම.

- ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීමේ අභිලාශයන් සපුරා ගැනීම උදෙසා බාලදක්ෂිකා ව්‍යාපාරය සමඟ ඇති කරගත් අවබෝධතා ගිවිසුම අනුව ක්‍රියා කරමින් ළමා ශ්‍රමයට එරෙහිව ලාංඡන නිර්මාණය කිරීමේ තරගයක් පැවැත්වීම හා එමඟින් බාලදක්ෂිකාවන්ට ළමා ශ්‍රමය පිළිබඳව පුළුල් ගවේශනයක් සිදු කිරීමට අවස්ථාව සැලසීම.

- ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීමේ වැඩසටහනට ක්‍රියාකාරීව සම්බන්ධ වන හා විශේෂ කුසලතා දක්වන බාලදක්ෂිකාවන්ට ප්‍රදානය කිරීමට නියමිත ලාංඡන නිර්මාණය කිරීමට දායක වූවන්ගේ කුසලතා ඇගයීම, ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන තේරීම හා තෝරා ගන්නා ලද ලාංඡනය එළිදැක්වීම සහ ළමා ශ්‍රමය සම්බන්ධ විශේෂ ලිපි රැසක් සහිත “කතිකාව” සඟරාව එළිදැක්වීම.

